2021 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

ධීවර අමාත්‍යාංශය

මාළිගාවත්ත, කොළඹ -10

වැය ශීර්ෂ අංකය : 151

අන්තර්ගතය	පිටු අංකය

1. ආයතනික පැතිකඩ

1.1. හැඳින්වීම 03
1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු 04
1.3. ප්‍රධාන කාර්යයන් 04
1.4. සංවිධාන සටහන 05
1.5. අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු / ආයතන 06
1.6. අමාත්‍යාංශය යටතේ පවතින ආයතනගත අරමුදල් 07
1.7. විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු 08 - 10

2. ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1. අරමුණු 11
2.2. අභියෝග සහ ඉලක්ක 12
2.3. ළඟාකර ගැනීම 12
2.4. ළඟාකර ගැනීම 13

3. 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1. මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය 14 - 15
3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 16
3.3. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය 17 - 18
3.4. මූල්‍ය ප්‍රකාශ සටහන් 19
3.5. ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය 20
3.6. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය 20
3.7. මු.රෙ.208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු වල නියෝජිතයකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන 21
3.8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය 22
3.9. විගණකාධිපතිවරයාගේ වාර්තාව 23

4. කාර්ය සාධන දර්ශක

4.1. ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) 24

5. තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1. හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු 25
5.2. ක්ෂේත්‍රයේ තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම 25 - 27
5.3. තිරසාර සංවර්ධන අරමුණු ලඟාකරගැනීමට ඇති අභියෝග සහ පරතර 28 - 29

6. මානව සම්පත් පැතිකඩ

6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය 30
6.2. ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපා ඇති ආකාරය 30
6.3. මානව සම්පත් සංවර්ධනය 30 - 31

7. **අනුකූලතා වාර්තාව** 32 - 38

01 - ආයතනික පැතිකඩ

1.1. හැඳින්වීම

ශ්‍රී ලංකාවේ අනන්‍ය ආර්ථික කලාපයට අයත් ව.කි.මී 517,000 ක මුහුදු ප්‍රදේශය, ජාත්‍යන්තර මුහුදු, කලපු හා අභ්‍යන්තර ජලාශ මනාලෙස වගකීම් සහිතව භාවිතා කරමින් ජාතික ආර්ථිකයට ඉහළ දායකත්වයක් සපයන ධීවර කර්මාන්තයක් බිහිකිරීම උදෙසා ධීවර අමාත්‍යාංශය කටයුතු කරන අතර මත්ස්‍ය සම්පතින් ස්වයංපෝෂිත ආර්ථිකයක් බිහිකිරීමට අවශ්‍ය පදනමට දායකත්වයක් සැපයීම උදෙසා විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධනය, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යාංශයත් අංක 2187/27 හා 2020.08.09 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ස්ථාපිත කොට ඇත.

ධීවර අමාත්‍යාංශයේ විෂය පථය යටතේ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව හා නෝත්සී ලිමිටඩ් ආයතනය ක්‍රියාත්මක වන අතර, විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධනය, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය, ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය, ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, ලංකා ධීවර සංස්ථාව, සීමාසහිත සීනෝර් පදනම යන ආයතන ක්‍රියාත්මක වේ.

"සෞභාග්‍යයේ දැක්ම**"** ප්‍රතිපත්ති වලට හා නියමිත අණපනත් වලට අනුකූලව ස්වයංපෝෂිත ධීවර ආර්ථිකයක් ස්ථාපිත කිරීම සඳහා ධීවර සම්පත තිරසාර ලෙස භාවිතා කිරීම සඳහා වන ප්‍රතිපත්ති, ක්‍රෙමෝපාය සහ සැළසුම් සම්පාදනය මෙන්ම අදාල රාජ්‍ය අමාත්‍යාංශය සඳහා ප්‍රතිපත්තිමය මඟපෙන්වීම් සිදුකිරීම ධීවර අමාත්‍යාංශයේ ප්‍රධානතම කාර්යභාරය වේ.

1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

ධීවර හා ජලජ සම්පත් සංරක්ෂණය සහ තිරසාර භාවිතය පිළිබඳ දකුණු ආසියානු කලාපයේ ප්‍රමුඛයා වීම.

මෙහෙවර

වර්තමාන හා අනාගත පරපුරේ යහපත උදෙසා ධීවර හා ජලජ සම්පත් භාවිතය කළමනාකරණය කිරීම.

ප්‍රතිපත්තිමය අරමුණු

- විද්‍යානුකූල පදනමකින් යුත් (science based) තොරතුරු භාවිතා කරමින් සම්පත් තිරසාර ලෙස කළමනාකරණය කිරීම.
- ධීවර කර්මාන්තය කලාපීය හා ජාත්‍යන්තර බැඳීම් වලට අනුකූල වීම.
- සමුද්‍රීය ධීවර නිෂ්පාදනය ඉහළ නැංවීම.
- ජලජීවී වගා සහ මිරිදිය ධීවර නිෂ්පාදනය ඉහළ නැංවීම.
- පසු අස්වනු හානි අවම කිරීම සහ අගය එකතු කිරීම ඉහළ නැංවීම.
- ඒක පුද්ගල මත්ස්‍ය පරිභෝජනය ඉහළ නැංවීම.
- අපනයන ආදායම් ඉහළ නැංවීම.
- විනෝදාත්මක ක්‍රියාකාරකම්, රැකියා හා ව්‍යාපාරික සංවර්ධනය සඳහා පවතින අවස්ථා ඉහළ නැංවීම.
- ධීවර ප්‍රජාවන්ගේ සමාජ ආර්ථික ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම.

1.3. ප්‍රධාන කාර්යයන්

- පාරිභෝගික අවශ්‍යතා තෘප්තිමත් කරමින් මත්ස්‍ය නිෂ්පාදන දරාගත හැකි මිලකට සැපයීම
- සාගර, කිවුල් දිය හා අභ්‍යන්තර ධීවර කර්මාන්තය සංවර්ධනය කිරීම
- ප්‍රතිපත්ති හා වැඩසටහන් විධිමත්ව සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම
- නිෂ්පාදන අන්තර්ජාතික තත්ත්වයට උසස් වන පරිදි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- මත්ස්‍ය නිෂ්පාදන අපනයනය සඳහා පහසුකම් සැලසීම

1.4. සංවිධාන සටහන



සීවර අමාත්‍යාංශය - සංවිධාන සැලැස්ම 2021
ගරු අමාත්‍යතුමා
ලේකම්
අධ්‍යක්ෂ ජනරාල් (ක්‍රමසම්පාදන)
අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන)
අධ්‍යක්ෂ ජනරාල් (තාක්ෂණ)
අධ්‍යක්ෂ (තාක්ෂණ)
අධ්‍යක්ෂ ජනරාල් (ඉංජිනේරු)
අධ්‍යක්ෂ (ඉංජිනේරු)
අතිරේක ලේකම් (සංවර්ධන)
අධ්‍යක්ෂ (සංවර්ධන)
අතිරේක ලේකම් (පාලන හා මානව සම්පත්)
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
ප්‍රධාන මූල්‍ය නිලධාරී
ප්‍රධාන ගණකාධිකාරී
ප්‍රධාන අභ්‍යන්තර විගණක
නි.අධ්‍යක්ෂ/ ස. අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන)
නි. අධ්‍යක්ෂ/ ස.අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන)
නි.අධ්‍යක්ෂ/ ස. අධ්‍යක්ෂ
නි. අධ්‍යක්ෂ/ ස.අධ්‍යක්ෂ
ඉංජිනේරු
නි.අධ්‍යක්ෂ/ ස.අධ්‍යක්ෂ (දෙපාර්තමේන්තුගත)
ස.අධ්‍යක්ෂ (දෙපාර්තමේන්තුගත)
සහකාර ලේකම් (පාලන)
නීති නිලධාරී
ගණකාධිකාරී (මුදල් හා ගෙවීම්)
ගණකාධිකාරී (සැපයුම් හා අත්තිකාරම්)
අභ්‍යන්තර විගණක
සීවර ප්‍රජා සම්බන්ධීකරණ නිලධාරී
පරිපාලන නිලධාරී
නොරතුරු හා සන්. තාක්ෂණ නිලධාරී
භාෂා පරිවර්තක
★ සහයක කාර්ය මණ්ඩලය
★ සහයක කාර්ය මණ්ඩලය - සංවර්ධන නිලධාරී, විදුලි හා කාර්මික ශිල්පී, රාජ්‍ය කළමනාකරණ සේවා නිලධාරී, රියදුරු, කාර්යාල කාර්ය සහයක තනතුරු අදාල වේ.

1.5. අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු / ආයතන

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව (DFAR)	**අපේක්ෂිත අරමුණු-**ශ්‍රී ලංකාවේ ධීවර හා ජලජ සම්පත් කළමනාකරණය, සංවර්ධනය හා සංරක්ෂණය **වගකීම් -** කලාපීය හා අන්තර්ජාතික සම්මුතීන්ට හා රෙගුලාසි වලට අනුකූලව 1996 අංක 02 දරන ධීවර හා ජලජ සම්පත් පනත ක්‍රියාත්මක කිරීම, බලගැන්වීම සහ ධීවර කළමනාකරණ කටයුතු හා නෛතික විධිවිධාන යාවත්කාලීන කිරීම.
නෝත්සී ලිමිටඩ්	**අපේක්ෂිත අරමුණු -** දේශීය ධීවර කාර්මිකයින් ගේ අවශ්‍යතා පිරිමසමින් උසස් ප්‍රමිතියකින් යුත් මාළු දැල් හා ධීවර ආම්පන්න සැපයීම **වගකීම් -** 2007 අංක 7 දරණ නව සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි කරමින් පිහිටුවන ලද මාළු දැල් නිෂ්පාදනය කරන සමාගමකි

විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධනය, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යාංශය යටතේ පවතින ආයතන

ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය (NARA)	**අපේක්ෂිත අරමුණු -** ජලජ සම්පත් පිළිබඳ පර්යේෂණ, ජලජ සම්පත් සංවර්ධනය, සංරක්ෂණය හා කළමනාකරණය. **වගකීම් -** 1981 අංක 54 දරණ ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතන පනත යටතේ ස්ථාපිත මෙම ආයතනය මගින් ජලජ සම්පත් හා ජලජීවී වගාව, ධීවර තාක්ෂණය, මත්ස්‍ය හා පසු අස්වනු තාක්ෂණය, පාරිසරික අධ්‍යයනය, සමුද්‍ර ජීව විද්‍යාව,ජල ශාස්ත්‍රය හා සාගර අධ්‍යයන කටයුතු සිදුකිරීම.
ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය **(NAQDA)**	**අපේක්ෂිත අරමුණු -** වගා කිරීම මත පදනම් වූ මිරිදිය ධීවර කර්මාන්තය හා ජලජීවී වගාව සංවර්ධනය සහ කළමනාකරණය. **වගකීම් -** 1998 අංක 53 දරණ ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරී පනත යටතේ ස්ථාපිත කරන ලද මෙම ආයතනය මඟින් මිරිදිය ධීවර කර්මාන්තය සහ ජලජීවී වගාවට අවශ්‍ය බීජ සැපයීම හා ව්‍යාප්ති සේවය ලබාදීම ඉස්සන් වගා කටයුතු අධීක්ෂණය, ජලජීවී වගා පුහුණු කටයුතු සැපයීම.
ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව **(CFHC)**	**අපේක්ෂිත අරමුණු -** ධීවර වරායන්, නැංගුරම්පොළවල් සැලසුම් කිරීම, ඉදිකිරීම හා පවත්වාගෙන යාම. **වගකීම් -** 1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ මෙම ආයතනය මගින් වර්තමානයේ ධීවර වරායන් 20 ක් හා නැංගුරම්පොළවල් 58 ක් පවත්වාගෙන යාම.
ලංකා ධීවර සංස්ථාව **(CFC)**	**අපේක්ෂිත අරමුණු -** මත්ස්‍ය නිෂ්පාදකයාට හා පාරිභෝගිකයාට උපරිම වාසි සැලසෙන අයුරින් මත්ස්‍ය වෙළඳපල සඳහා දායක වීම. **වගකීම් -** 1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික සංස්ථා පනත යටතේ ස්ථාපිත මෙම ආයතනය මගින් මාළු මිලදී ගැනීම හා විකිණීම, අයිස් නිපදවීම හා විකිණීම, ශීතාගාර පහසුකම් පවත්වාගෙන යාම හා මත්ස්‍ය අතුරු නිෂ්පාදන විකිණීම සිදුකෙරේ.
සීමාසහිත සීනෝර් පදනම	**අපේක්ෂිත අරමුණු -** ධීවර කර්මාන්තයට අදාල වන්නාවූ යෙදවුම් හා සැපයුම් ලබාදීම. **වගකීම් -** 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ ලියාපදිංචි කර ඇති මෙම ආයතනය මගින් ෆයිබර් ග්ලාස් ආශ්‍රිත උපකරණ හා ඔරු,බෝට්ටු නිෂ්පාදනය කරන අතර අනිකුත් සියළුම ධීවර ආම්පන්න අලෙවිය සිදු කරනු ලබයි.

1.6. අමාත්‍යාංශය යටතේ පවතින ආයතන අරමුදල්

ආයතනය	වැඩසටහන්		ප්‍රාග්ධන අයවැය ප්‍රතිපාදන (රු.මි)
ධීවර අමාත්‍යාංශය (MF)	නව තාක්ෂණය හඳුන්වාදීම සඳහා සහාය (FSDD)	60	462.49
	ධීවර ප්‍රජා සවිබල ගැන්වීම (FSDD)	40	
	ශක්‍යතා කටයුතු සහ විමර්ශන කටයුතු	16.50	
	කලපු සංවර්ධනය හා සංරක්ෂණය	335.38	
	"ඔරුවැල්ල" පුවත්පත හා "ධීවර නවෝදය" ගුවන් විදුලි වැඩසටහන	10.61	
ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව(DFAR)	සංවර්ධන ක්‍රියාකාරකම්		107.00
වරාය සංවර්ධන ව්‍යාපෘතිය	ගන්දර ධීවර වරාය සංවර්ධනය හා වෙල්ලමන්කර නව ධීවර වරායක් ඉදිකිරීම	605	2755.50
	බලපිටිය ධීවර වරාය ඉදිකිරීම	2	
	ගන්දර ධීවර වරාය ඉදිකිරීම	1710	
	මීගමුව කලපුව සංවර්ධන ව්‍යාපෘතිය	73.50	
	රකව නැංගුරම්පොළ ඉදිකිරීම	215	
	මාවැල්ල නැංගුරම්පොළ ඉදිකිරීම	150	

1.7. විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

01. හරිත වරාය සංකල්පය යටතේ බේරුවල ,ගාල්ල, පුරාණ වැල්ල සහ කුඩාවැල්ල ධීවර වරායයන් සංවර්ධනය කිරීම

ජාත්‍යන්තර ප්‍රමිතින්ට අනුකූලව හරිත වරාය සංකල්පය යටතේ බේරුවල, ගාල්ල, පුරාණ වැල්ල සහ කුඩාවැල්ල යන ධීවර වරායයන් සංවර්ධනය කිරීම සඳහා වන මෙම ව්‍යාපෘතිය ප්‍රංශ රජයේ මූල්‍යාධාර මත ක්‍රියාත්මක කිරීමට නියමිතය. මේවන විට ව්‍යාපෘතිය සඳහා අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම සහ තාක්ෂණික ශක්‍යතා අධ්‍යයනය අවසානයේ එක් එක් වරායන්හි සිදු කල යුතු යෝජිත ක්‍රියාකාරකම් තෝරාගෙන අවසන් කොට ඇති අතර පාරිසරික හා සමාජයීය ශක්‍යතා අධ්‍යයනය සිදු කර අවසන් කර එහි වාර්තාවන් සකසමින් පවති. ධීවර වරාය පහසුකම් පුළුල් කිරීම හා තෝරාගත් වරායන් හරිත වරායන් බවට පරිවර්තනය කිරීම, ධීවර ප්‍රජාවගේ ජීවනෝපායයන් වැඩි දියුණු කිරීම, ඉහළ ගුණාත්මයේ මත්ස්‍ය නිෂ්පාදන සඳහා වෙළඳපොළ ප්‍රවේශය ඇති කිරීම සහ ධීවර සුභසාධනය නංවාලීම මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණු වේ.

ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය යුරෝ.මි.137.5 ක් වන අතර ව්‍යාපෘති කාලය වසර 5 (2021-2026) කි. ව්‍යාපෘතිය 2023 වසරේ දී ආරම්භ කිරීමට නියමිතය.

02. ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ ධීවර හා වෙරළ කලාප කළමනාකරණය සඳහා ප්‍රමුඛතාවය ලබාදීම සඳහා උපදේශණ සේවා සහ විශ්ලේෂණ (තාක්ෂණික සහාය) ලබාගැනීම

සමුද්‍රීය හා ජලජීවී වගා යන අංශවල තිරසාර නොවන අයුරින් මත්ස්‍ය අස්වනු (Over exploitation) නෙලීම සහ ධීවර සම්පත් කළමනාකරණ ගැටළු විසඳීම සඳහා උපාය මාර්ග සකස් කිරීම වෙනුවෙන් පහත දැක්වෙන අධ්‍යයනයන් සිදු කිරීම මෙහි අරමුණ වේ.

i. ජලජීවී වගාවේ ආයෝජන
ii. බහුදින ධීවර කටයුතු පිළිබඳ මූල්‍ය හා ජීව විද්‍යාත්මක විශ්ලේෂණය
iii. කුඩා ප්‍රමාණයේ සමුද්‍රීය මත්ස්‍ය තොග තක්සේරු කිරීම සඳහා නාරා ආයතනය සහ ධීවර දෙපාර්තමේන්තුව වෙත තාක්ෂණික සහාය ලබාදීම
iv. පොකිරිස්සන් තොග තක්සේරු කිරීම සඳහා නාරා ආයතනය සහ ධීවර දෙපාර්තමේන්තුව වෙත තාක්ෂණික සහාය ලබාදීම
v. ශ්‍රී ලංකාවේ සමුද්‍රීය ධීවර කළමනාකරණය සඳහා ජෛව ආර්ථික ආකෘති (Bio economic modeling) නිර්මාණය කිරීම

ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය යටතේ ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතියේ මුළු පිරිවැය ඇස්තමේන්තුව රු.මි.130 (ඇ. ඩො. 700,000) වන අතර ඒ සඳහා ලෝක බැංකු ප්‍රදානයක් ලබා දී ඇත. උක්ත අධ්‍යයනයන්ට අදාළව අතුරු වාර්තාව මේ වනවිට කෙටුම්පත් කර ඇත.

අංකය	ව්‍යාපෘතියේ නම	අරමුදල් සපයන ආයතනය	TEC රු.මී	ව්‍යාපෘති කාලය
01.	ප්‍රංශ රජයේ මූල්‍යාධාර යටතේ හරිත වරායන් ලෙස බේරුවල, ගාල්ල, පුරාවැල්ල සහ කුඩාවැල්ල යන ප්‍රදේශවල ධීවර වරායන් සංවර්ධනය කිරීම	ප්‍රංශ සංවර්ධන නියෝජිත ආයතනය	30,000.00 සෛවරී ණය- EUR 100.00 දේශීය අරමුදල් ප්‍රභවය - EUR 20.00 පෞද්ගලික අංශය - EUR 10.00 ආධාර - EUR 7.5 එකතුව- EUR 137.5	අවු.05
02.	ශ්‍රී ලංකා රජය සහ ආසියානු සංවර්ධන බැංකුව (ADB ව්‍යාපෘතිය) සමඟ අරමුදල් සපයන උතුරේ ක්‍රියාත්මක කරන ලද ධීවර සංවර්ධන ව්‍යාපෘතිය	ආසියානු සංවර්ධන බැංකුව (ADB)	130	අවු.05
03.	ධීවර හා ජලජ සම්පත් සංවර්ධන දෙපාර්තමේන්තුවෙහි ලියාපදිංචි වී ඇති සියලුම බහුවිධ ධීවර යාත්‍රා සඳහා ගොඩබිම් පාදක ධීවර අධීක්ෂණ මධ්‍යස්ථානය සහ අභ්‍යන්තර වන්ද්‍රිකා මත පදනම් වූ VMS ට්‍රාන්ස්පෝන්ඩර් ඒකක 4244ක් සැපයීම සහ ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය	ඔස්ට්‍රේලියානු ආධාර	1207.425	අවු.03

හුවමාරු වටිනාකම 2021.06.01 දිනට

1 USD = 197.47 LKR

1 EUR = 241.285 LKR

1.7.1 දැනට ක්‍රියාත්මක වෙනත් ක්‍රියාකාරකම්

1. **එක්ස්ප්‍රස් පර්ල් නෞකාව ගිනිගෙන මුහුදුබත් වීම හේතුවෙන් ජීවනෝපාය අහිමි වූ ධීවර ක්ෂේත්‍රයට සිදු වූ හානිය සඳහා වන්දි ගෙවීම.**

ඉන්දියාවේ හසිරා වරායේ සිට කන්ටේනර් 1486ක් සහිතව භාණ්ඩ ප්‍රවාහනයේ යෙදෙමින් තිබූ සිංගප්පූරුවේ ධජය සහිත MV එක්ස්ප්‍රස් පර්ල් භාණ්ඩ යාත්‍රාව මුළුමනින්ම ගිනි ගත්තේ 2021 මැයි 20 වන දින ශ්‍රී ලංකා වෙරළට කිලෝමීටර් 9.5 ක් දුරින් නැංගුරම් ලා තිබියදීය.

එම ගිනි ගැනීම හේතුවෙන් නැවෙහි කන්ටේනර් වල අඩංගු වූ ප්ලාස්ටික්, තෙල්, රසායනික ද්‍රව්‍ය කාන්දු වීම නිසා ශ්‍රී ලංකාවේ බටහිර වෙරළ තීරයේ සමුද්‍රීය පරිසර පද්ධතියට දැඩි හානියක් සිදු විය. මෙම පාරිසරික හානිය නිසා කළුතර සිට මීගමුව දක්වා ප්‍රදේශයේ ධීවරයින්ගේ, ධීවර ආම්පන්න සහ බෝට්ටුවල ආරක්ෂාව සහතික කිරීම සඳහා වහාම ධීවර තහනම් කලාපයක් පැනවීමට රජය විසින් පියවර ගන්නා ලදී. මෙම ධීවර තහනම් කලාපය පැනවීම නිසා ජීවිකාව අහිමි වූ සෘජු හා වක්‍ර ලෙස ධීවර රැකියාවේ යෙදුන ධීවරයින් සඳහා වන්දි මුදලක් ලබා දීමට කටයුතු කරන ලදී.

මෙහිදී අදාළ නාවුක සමාගම විසින් අතුරු වන්දි මුදලක් ලබා දුන් අතර එයින් රුපියල් මිලියන 345ක මුදලක් මේ වන විට ධීවරයින් අතර බෙදා දීමට කටයුතු කර ඇත.

2. **දේශීය ටින් මාළු නිෂ්පාදනය ඉහළ නැංවීම.**

ශ්‍රී ලංකාව මත්ස්‍ය ආශ්‍රිත නිමැවුම් වන ටින් මාළු, කරවල, හාල් මැස්සන් හා උම්බලකඩ ආනයනය සඳහා වාර්ෂිකව ඉතා ඉහල විදේශ විනිමයක් වැය කරනු ලබයි. 2020 වර්ෂයේදී මෙකී මත්ස්‍ය නිෂ්පාදන ආනයනය සඳහා රු. මිලියන 35,504 ක් පමණ වැයකර ඇති අතර, මින් රු. මිලියන 10,764 ක් එනම්30%ක පමණ ප්‍රමාණයක් ටින් මාළු සඳහා වැයකර ඇත.

රට හදන සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශයෙහිද දේශීයව ටින් මාළු නිෂ්පාදනය වර්ධනය කිරීමට අවශ්‍ය එහෙත් රට තුල නොමැති මත්ස්‍ය විශේෂ ආනයනය කිරීමේ ක්‍රමවේදය සරල කිරීමට යෝජනා කර ඇත. ඒ අනුව දේශීය ටින් මාළු කර්මාන්තශාලා සඳහා දේශීය වශයෙන් අමුද්‍රව්‍ය නොමැති හෝ අඩු අවස්ථා වලදී එම අමුද්‍රව්‍ය බදු සහන යටතේ ආනයනය කිරීමට අවශ්‍ය පහසුකම් තවදුරටත් පුළුල් කර ඇත. එසේම මෙම සහන යටතේ 2019 වසරට පෙර 6 ක්ව පැවති ප්‍රධාන පෙලේ ටින් මාළු කර්මාන්තශාලා ගණන මේ වන විට 9 දක්වා වර්ධනය වී ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙස මෙකී ටින්මාළු කර්මාන්තශාලා මඟින් නිෂ්පාදනය කරනු ලබන ටින්මාළු ප්‍රමාණයද 2019 වර්ෂයට සාපේක්ෂව 2021 වර්ෂය වන විට ආසන්න ලෙස 200%කින් පමණ වර්ධනය වී ඇති අතර, මෙනිසා 2019 වර්ෂයට සාපේක්ෂව 2021 වර්ෂයේ ආනයනික ටින්මාළු සඳහා වැයකර ඇති ආනයන වියදම රු. මිලියන 8,760කින් පමණ අඩු වී ඇත.

02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

රජය මඟින් 2021 වසර සඳහා වෙන්කරන ලද සම්පූර්ණ ප්‍රාග්ධන අයවැය ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි. 3596.99 කි. එම වසර තුල වෙන් කරන ලද ප්‍රාග්ධන මුදල් ප්‍රමාණයෙන් රු.මි.2666.42 ක ප්‍රමාණයක් වැය කොට ඇත.

එසේම, 2021 ජනවාරි - දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදය තුළදී මුළු මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 435,910 ක් වන අතර කරදිය හා මිරිදිය ධීවර කර්මාන්තය පිළිවෙලින් මෙට්‍රික් ටොන් 331,675 ක් සහ මෙට්‍රික් ටොන් 104,235 ක් ලෙස මත්ස්‍ය නිෂ්පාදනයට දායකත්වයක් සපයා ඇත.

ජනතාවගේ පෝෂණ මට්ටම් හා යහපත් සෞඛ්‍ය තත්ත්වය වර්ධනය කිරීම සඳහා ප්‍රෝටීන් මූලාශ්‍රයක් ලෙස මත්ස්‍ය පරිභෝජනය ඉතා වැදගත් වේ. 2021 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුළ ඒක පුද්ගල මත්ස්‍ය පරිභෝජනය දිනකට ග්‍රෑම් 37.1 ක් වුවද එම ප්‍රමාණය ඉදිරි කාලය තුළ වැඩිවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ජාතික ආදායමට ධීවර ක්ෂේත්‍රයේ වර්ධනීය දායකත්වය සැළකීමේදී, මත්ස්‍ය අපනයන දායකත්වය ප්‍රශංසාත්මක ලෙස ඉහළ මට්ටමක රැඳී ඇත. 2021 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදය තුලදී, මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන අපනයනය මෙට්‍රික් ටොන් 26,479 ක් ලෙස වර්ධනය වී ඇති අතර, එහි අපනයන වටිනාකම රු.මි. 63,222 ක් ලෙස වාර්තා වී ඇත.

ගරු ජනාධිපතිතුමාගේ “සෞභාග්‍යයේ දැක්ම” ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ධීවර අංශයට අදාළ අභිලාෂයන් සාක්ෂාත් කරගැනීමට පසුගිය වර්ෂය තුල දමන ලද පදනම තවදුරටත් ශක්තිමත් කරමින්, අවශ්‍ය සැළසුම් හා ක්‍රමෝපායන් තවදුරටත් අධිෂ්ඨානශීලී ලෙස ඉදිරියට ගෙනයමින්, කෝවිඩ් වසංගත තත්ත්වය තුළ වුවද, සියලු අභියෝග ජය ගනිමින් අපේක්ෂිත ඉලක්ක අත්පත් කරගෙන සාධනීය ප්‍රතිඵල හා ජයග්‍රහණයන් ලභාකරගත හැකිවූ අතර ඉදිරි අවුරුදු කිහිපය තුල “සෞභාග්‍යයේ දැක්ම” ප්‍රතිපත්තිය ඉටුකරගනිමින් ඒ හා සමගාමීව එක්සත් ජාතීන්ගේ තිරසර ඉලක්ක සපුරා ගැනීමේ සැලසුම් හා ව්‍යාපෘති දියත් කිරීම කෙරෙහි ද අවධානය යොමු කොට ඇත.

2.1 අරමුණු

01. මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීම
02. ආහාර සුරක්ෂිතතාවය, ආහාර වල සෞඛ්‍යාරක්ෂිතභාවය සහ පෝෂණය ඉහළ නැංවීම
03. සම්පත් තිරසාර ලෙස කළමනාකරණය කිරීම
04. පාලනය ශක්තිමත් කිරීම
05. පසු අස්වනු හානි අවම කිරීම හෝ තුරන් කිරීම
06. අපනයන ඉහළ නැංවීම
07. ධීවර ප්‍රජාවගේ සමාජ - ආර්ථික තත්ත්වයන් ඉහළ නැංවීම

2.2 අභියෝග හා ඉලක්ක

01. ධීවර කර්මාන්තය හා ජලජීවී වගාව යෝග්‍ය අන්දමින් සංවර්ධනය කිරීම
02. අභ්‍යන්තර ජලාශයන්හි ඇති අඩුවෙන් පරිභෝජනය කරනු ලබන හෝ පරිභෝජනය නොකරනු ලබන මත්ස්‍ය සම්පත් නෙලා ගැනීම ප්‍රවර්ධනය කිරීම
03. වැඩි පිරිසක්ගේ ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා ප්‍රමාණවත් ආර්ථික මට්ටම් සහිත රැකියා අවස්ථා ක්ෂේත්‍රය තුළ නිර්මාණය කිරීම
04. දේශීය වශයෙන් අලෙවි කරනු ලබන මසුන්ගේ හා මත්ස්‍ය නිෂ්පාදන වල ප්‍රමිතිය හා ආහාර සෞඛ්‍යාරක්ෂිතාව තහවුරු කිරීම
05. නිෂ්පාදන හා සැපයුම්දාමය තුළ ගුණාත්මක යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම
06. අපනයන අරමුණු කොටගත් ධීවර කර්මාන්තය සහ ජලජීවී වගා ව්‍යාපෘති සඳහා ආයෝජනයන් ප්‍රවර්ධනය කිරීම
07. ධීවර කළමනාකරණ ක්‍රමවේද නිර්මාණය, සැලසුම්කරණය හා ක්‍රියාත්මක කිරීමේ දී ධීවර ප්‍රජාවන් සහභාගි කර ගැනීම

2.3 ළඟා කර ගැනීම (Achievements) – 2021 වර්ෂය සඳහා රු.මී. 100 ක මුදලක් පහත සඳහන් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා සමාජ සංවර්ධන අංශය වෙත වෙන් කරන ලදී.

අනු අංක	වැඩසටහන	2021 වර්ෂය සඳහා වෙන් වූ ප්‍රතිපාදන මුදල (රු.මී)	ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති	වැය කිරීමට බලාපොරොත්තු වූ මුදල (රු.මී)	වැය කරන ලද සත්‍ය මුදල (රු.මී)	භෞතික ප්‍රගතිය (%)
1	නව තාක්ෂණය සඳහා සහාය	60	මත්ස්‍ය බිම් සොයා ගැනීම සඳහා මෘදුකාංගයක් සැකසීම පරිසර හිතකාමී අඩු ඉන්ධන / විකල්ප ඉන්ධන/ බල ශක්ති සහිතව වැඩි දියුණු කළ යාත්‍රාවක් හඳුන්වාදීම හා ප්‍රවර්ධනය දැනට නෙළා නොගන්නා මසුන් වර්ග නෙළා ගැනීම සඳහා පර්යේෂණ හා නවීන උපකරණ භාවිතය වෙරළාසන්න ධීවර මත්ස්‍ය බිම් 10 ක් සඳහා FAD සවිකිරීම වෙරළාශ්‍රිත මුහුදු තීරයේ මත්ස්‍ය ගහනය වැඩි කිරීම සඳහා අබලි වාහන භාවිතයෙන් ඇටවුම් යෙදවීම හීනවූ මත්ස්‍ය ගහනය ඉහළ නැංවීමට මසුන් තැම්පත්කිරීම - මසුන් වර්ග හා ප්‍රමාණයන් හඳුනා ගැනීමේ පර්යේෂණ කටයුතු	60	39.2	68%
2	ධීවර ප්‍රජාව ශක්තිමත් කිරීම	40	අක්‍රියව පවතින ධීවර සමූපකාර සමිති 300 ප්‍රතිසංවිධානය කිරීම අලුතින් ධීවර කර්මාන්තය ආරම්භ කළ ධීවර සංවිධාවල සාමාජිකයින් සඳහා නවීන බෝට්ටු හා දැල් කට්ටල ලබාදීම. කුඩා පරිමාණ ධීවර යාත්‍රා සඳහා ප්‍රජා සහභාගීත්ව පදනමින් බහාලුම් ලබාදීම සාගර විශ්ව විද්‍යාලය භාවිතා කර තරුණ තරුණියන් සඳහා ධීවර කටයුතු පිළිබඳ තාක්ෂණික හා පුහුණු වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම. කාන්තා ධීවර සමිති 250 බල ගැන්වීම	40	16.8	53%

2.4 ළඟා කර ගැනීම (Achievements)

අනු අංක	වැඩසටහන	2021 වර්ෂය සඳහා වෙන් වූ ප්‍රතිපාදන මුදල (රු.මි)	ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති	වැය කිරීමට බලාපොරොත්තු වූ මුදල (රු.මි)	වැය කරන ලද සත්‍ය මුදල (රු.මි.)	**අතැති බිල්පත් (රු.මි.) 31.12.2021**	භෞතික ප්‍රගතිය (%)
1	බහුදින ධීවර යාත්‍රා සඳහා පහසුකම් සැලසිය හැකි පරිදි පවත්නා සියළුම ධීවර වරායන් නවීකරණය කිරීම	605	වෙල්ලමන්කර ධීවර වරාය ඉදි කිරීම	605	512.6	51.4	සත්‍ය – 100% විචල්‍යතාවය – ගමන්මග – 45%
		1590	ගන්දර ධිවර වරාය ඉදිකිරීම	1590	1595.3	129.2	14%
		2	බලපිටිය ධීවර වරාය ඉදිකිරීම	2	1.03	-	-
		43	කලමැටිය ධීවර වරාය ඉදිකිරීම	43	12.46	4.89	රේල් පිලි වැඩ - 100 % ලී බඩු - 100 % අමතර ක්‍රියාකාරකම් - 75 % බිම් අලංකරණය-50 % CCTV - 20% යකඩ වැඩ - 0%
		73.5	මීගමු කලපුව සංවර්ධනය කිරීම	73.5	11.02	7.02	සැළසුම් සකස් කිරීම අවසන් කර ඇත, ප්‍රසම්පාධන කටයුතු ක්‍රියාත්මක කරමින් පවතී
		215	රැකව නැංගුරම්පල ඉදිකිරීම	215	198.68	18.98	88% (දිය කඩනය ඉදිකිරීම- දිග 300m, 55 m groyne)
		150	මාවැල්ල නැංගුරම්පල ඉදිකිරීම	150	145.14	-	42% (දිය කඩනය ඉදිකිරීම - දිග 300m , 55 m groyne)
		16.5	ශක්‍යතා අධ්‍යනය	16.5	8.18	6.73	75% (අම්බලන්ගොඩ, හික්කඩුව සහ වාලච්චේන ධීවර වරායන්)

03 - 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1. මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2021 රු.		සටහන	තත්‍ය 2021 රු.	නැවත ගලපන ලද 2020 රු.	
-	**ආදායම් ලැබීම්**		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසීඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		2,693,148,000	1,297,590,000	ඒසීඒ-3
-	තැන්පතු		189,514,931	72,423,742	ඒසීඒ-4
-	අත්තිකාරම් ගිණුම්		9,102,093	9,587,110	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**2,891,765,024**	**1,379,600,852**	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**2,891,765,024**	**1,379,600,852**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		-	-	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		**2,891,765,024**	**1,379,600,852**	

	අඩු කළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**		-	-	
122,964,130	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	**5**	112,138,631	115,100,728	
95,119,820	අනෙකුත් භාණ්ඩ හා සේවා	**6**	72,077,585	73,692,403	**ඒසිඒ-2(ii)**
385,980,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	**7**	301,858,617	42,665,990	
-	පොළී ගෙවීම්	**8**	-	-	
1,186,050	වෙනත් පුනරාවර්තන වියදම්	**9**	226,281	21,000	
605,250,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**486,301,114**	**231,480,121**	
	මූලධන වියදම්				
23,700,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	**10**	8,115,637	15,572,043	
246,800,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	**11**	46,523,499	81,982,353	
70,610,000	ප්‍රාග්ධන මාරුකිරීම්	**12**	49,844,546	60,723,000	**ඒසිඒ-2(ii)**
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	**13**	-	-	
1,500,000	හැකියා වර්ධනය	**14**	507,065	745,000	
3,229,390,000	වෙනත් මූලධන වියදම්	**15**	2,566,812,790	135,363,711	
3,572,000,000	**මුළු මූලධන වියදම් (උ)**		**2,671,803,537**	**294,386,107**	
	තැන්පතු ගෙවීම්		49,619,736	290,404,961	**ඒසිඒ-4**
	අත්තිකාරම් ගෙවීම්		7,036,504	7,433,796	**ඒසිඒ-5**
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		**56,656,240**	**297,838,757**	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		3,214,760,891	823,704,985	
4,177,250,000	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		(322,995,867)	555,895,867	
	අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		(322,995,867)	555,895,867	**ඒසිඒ-7**
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	-	**ඒසිඒ-3**
			(322,995,867)	555,895,867	

3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

2021 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තත්‍ය 2021 රු.	2020 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	670,623,450	605,570,552
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	21,886,221	23,951,809
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	-
මුළු වත්කම්		**692,509,671**	**629,522,361**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		(178,880,786)	(36,920,002)
දේපළ පිරියත හා උපකරණ සංචිතය		670,623,450	605,570,552
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඒ-5(බී)	-	-
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	200,767,007	60,871,811
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	-
මුළු වගකීම්		**692,509,671**	**629,522,361**

පිටු අංක7 සිට 66 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 67 සිට 78 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරව කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය : 22. 02. 24
ආර්.එම්.අයි. රත්නායක
ලේකම්
ධීවර අමාත්‍යාංශය
02 වන මහල, නව මහලේකම් කාර්යාලය,
[illegible]වත්ත, කොළඹ - 10.

.....
ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය :

.....
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම :
දිනය : 2022.02.24
කේ.පී. මිල්ටන් එස්. පෙරේරා
ප්‍රධාන මූල්‍ය නිලධාරි
ධීවර අමාත්‍යාංශය
නව මහලේකම් කාර්යාලය
[illegible]

2

3.3. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-සී

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	තත්‍ය	
		නැවත ගලපන ලද
	2021	**2020**
	රු.	රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		-
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	76,337,798	33,020,565
අග්‍රිම ලැබීම්	2,693,148,000	1,297,590,000
අත්තිකාරම් අයකර ගැනීම්	7,633,379	643,907
තැන්පතු ලැබීම්	90,332,307	10,897,412
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**2,867,451,484**	**1,342,151,884**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	184,432,748	223,316,255
සහනාධාර සහ මාරුකිරීම්	32,633,617	-
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	8,292,134	11,658,626
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	-	30,000,000
අත්තිකාරම් ගෙවීම්	7,036,504	5,293,786
තැන්පතු ගෙවීම්	49,619,736	11,552,704
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**282,014,739**	**281,821,371**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**2,585,436,745**	**1,060,330,513**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
භිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	**-**	**-**

<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	2,585,436,745	1,060,330,513
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**2,585,436,745**	**1,060,330,513**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	**(2,585,436,745)**	**(1,060,330,513)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	-	-
<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

ඒසීඒ-සී

3.4. මූල්‍ය ප්‍රකාශ සටහන්

වාර්තා කිරීමේ පදනම

1) වාර්තාකරණ කාලපරිච්ඡේදය

2021 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම්වල ඓතිහාසික පිරිවැය නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩිදියුණු කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසළකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම් වේ.

6) මුදල් හා මුදල් සමාන දෑ

2021 දෙසැම්බර් 31 දිනට අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

3.5. ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය(රු.)	අවසන් ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
2002.01.01	රජයේ ගොඩනැගිලි සහ නිවාස කුලී	100	100	-	-
2002.02.99	පොලිය - අනෙකුත්	850	970	956	99%
2003.02.99	පරිපාලනාත්මක ගාස්තු හා ගෙවීම් - විවිධ	20,000	75,000	70,972	95%

3.6. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගි කරනු ලැබූ ප්‍රතිපාදන,අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදනයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	252,100	605,250	486,301	80.35%
ප්‍රාග්ධන	3,572,000	3,572,000	2,671,804	74.80%

3.7. මුරෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු වල නියෝජිතයකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. ,000

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		උපයෝගී කරගන්නා ලද ප්‍රතිපාදන, ලබාදුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන	
1	ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව	වොරන්ට් බලපත්‍ර නිකුත් කිරීම සඳහා	9	9	100%
2	දි. ලේ - කොළඹ, ගම්පහ, කළුතර	එක්ස්ප්‍රස් පර්ල් නෞකාව ගිනිගැනීමෙන් ජීවනෝපාය අහිමි වූ ධීවර ක්ෂේත්‍රයේ ජනතාවට වන්දි ගෙවීම	269,225	269,225	100%
3	රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව	අමාත්‍යාංශයේ නාමය සඳහා නාම පුවරු සකස් කිරීම	856	856	100%
4	ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව	තාක්ෂණය හදුන්වා දීම තුලින් ධීවර නිෂ්පාදන ඉහල නැංවීමේ වැඩසටහන් සඳහා	28,000	20,592	100%
5	ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව	ධීවර ප්‍රජාව ශක්තිමත් කිරීම සහ සමාජ සංවර්ධන වැඩසටහන් සඳහා	30,980	10,241	100%
6	වෙරළ සංරක්ෂණ හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව	වෙල්මංකර, ගන්දර, මීගමුව, රූකව නැංගුරම්පොලවල් සහ කලපු ඉදිකිරීමේ බලපත්‍ර අලුත් කිරීම සඳහා	275	275	100%
7	ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය	හික්කඩුව ධීවර නිවාස සංකීර්ණය ප්‍රතිසංස්කරණය සඳහා	39,012	39,012	100%
8	ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව සහ දිස්ත්‍රික් ලේකම්, යාපනය	කලපු සංවර්ධනය සහ සංරක්ෂන කාර්යයන් සඳහා	47,734	15,390	100%

3.8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. ,000

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2021 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2021 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණය ට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්		149,212		
9152	යන්ත්‍රෝපකරණ		339,821		
9153	ඉඩම්		5,172		
9154	අස්පෘශ්‍ය වත්කම්		-		
9155	ජීව විද්‍යාත්මක වත්කම්		-		
9160	කෙරීගෙන යන වැඩ		176,419		
9180	බදු දෙන ලද වත්කම්		-		

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE



මගේ අංකය
எனது இல.
My No. FLS/B/MF/2/21/01

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2022 ජූනි 21 දින



ලේකම්

ධීවර අමාත්‍යාංශය

ධීවර අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ධීවර අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ධීවර අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට ධීවර අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72 23
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ

ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල විෂයය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල විෂයය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

විගණන නිරීක්ෂණය	මෙම වාර්තාවේ ඡේදයට යොමුව
සමාලෝචිත වර්ෂයේ මිලදී ගැනීම්	1.6.2.1

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 අග්‍රිම සැසඳුම් ප්‍රකාශය

භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත SA-51 අනුව වෙනත් ශීර්ෂ විසින් අමාත්‍යාංශයේ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුමට බැර කර තිබුණු රු.2,369,661 ක් පිළියෙල කර තිබුණු අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ අනෙකුත් ශීර්ෂ විසින් අත්තිකාරම් "බී" ගිණුමට කරන ලද බැර කිරීම් යටතේ දක්වනු වෙනුවට අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තා කරන ආයතනය විසින් අත්තිකාරම් "බී" ගිණුම වෙනුවෙන් කරන ලද හර කිරීම් යටතේ දක්වා තිබුණි.

1.6.2 **මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

1.6.2.1 **මූල්‍ය නොවන වත්කම්**

මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය (ACA-6) සඳහා ඉදිරිපත් කර තිබුණු SA 82 භාණ්ඩාගාර පරිගණක මුද්‍රිතය අනුව සමාලෝචිත වර්ෂයේ ස්ථාවර වත්කම් මිලදී ගැනීම් වටිනාකම රු.71,020,869 ක් ලෙස දක්වා තිබිය දී මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ වර්ෂය තුල මූලධන වත්කම් අත්පත් කරගැනීම් යටතේ රු.46,523,499 ක් දක්වා තිබුණු හෙයින් රු.24,497,370 ක වෙනසක් විය.

1.6.2.2 **තැන්පතු ගිණුම් ශේෂ**

ධීවර අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ගිණුමේ අවුරුදු 5 වැඩි තැන්පතු ශේෂය රු.1,227,112 ක් විය. එයින් රු. 555,553 ක රඳවා ගත් කොන්ත්‍රාත් තැන්පතු දෙකක් අවසන් බිල්පත් ඉදිරිපත් නොවීම හේතුවෙන් ද රු.671,559.ක රඳවා ගත් මුදල් කොන්ත්‍රාත්තුවේ අඩුපාඩු සම්පූර්ණ නොකිරීම හේතුවෙන් ද රඳවාගෙන තිබුණු අතර එම ශේෂ නිරවුල් කර මුදල් රෙගුලාසි ප්‍රකාර රාජ්‍ය ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි.

1.6.2.3 **අග්‍රිම ගිණුමේ ශේෂය**

2018 වර්ෂයේ සිට පැවත එන රු.6,400,000 ක්වූ ලංකා ධීවර සංස්ථාවේ නොපියවූ අග්‍රිම ශේෂයක් 2021 ජනවාරි 01 දිනට අමාත්‍යාංශ අග්‍රිම ගිණුම්වල පෙන්වා නොතිබුණු අතර 2021 පෙබරවාරි මස ශ්‍රී ලංකා රේගුව් මඟින් තැන්පත් කරන ලද රු.1,083,663 කින් එම හිඟ අග්‍රිමයෙන් කොටසක් පියවා තිබුණු අතර හිඟ ශේෂය ලෙස රු.5,316,337 ක් භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත SA 70 වාර්තාවේ දක්වා තිබුණි. මෙම නොපියවූ අග්‍රිමය පියවීම් කිරීමට ලංකා ධීවර සංස්ථාවෙන් රු.50,000 බැගින් 2021 ඔක්තෝබර්, නොවැම්බර් හා දෙසැම්බර් මාසවල අයකර ගත් රු.150,000 ක් භාණ්ඩාගාරයට යවා තිබුණි. 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ හා ACA 4 අනුව නොපියවූ අග්‍රිම ශේෂය (7002-0-0-089-18) හෙළිදරව් කර නොතිබුණි.

2. **මූල්‍ය සමාලෝචනය**

2.1 **වියදම් කළමනාකරණය**

(අ) සංවර්ධන ව්‍යාපෘති 03 ක මූලික වියදම් ඇස්තමේන්තු ප්‍රතිපාදන මුදලින් මුදල් රෙගුලාසි අංක 66 යටතේ වර්ෂය තුළ දී රු.434,122,000 ක් වෙනත් සංවර්ධන ව්‍යාපෘතිවලට මාරුකර තිබූ අතර එසේ මාරුකිරීම් කළ පසුද සියයට 49 ත් 93 ත් අතර පරාසයක ප්‍රමාණයක් ඉතිරි වී තිබුණි. ඒ අනුව කළමනාකරණයේ සැලසුම්වල දුර්වලතාවය නිසා ව්‍යාපෘති සඳහා අධිප්‍රතිපාදන සලසා තිබීමක් හා සංවර්ධන කටයුතු කිරීමේ මන්දගාමී බවක් නිරීක්ෂණය විය.

මේ සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(i) කලපු සංවර්ධන හා සංරක්ෂණ ව්‍යාපෘතිය සඳහා 2021 වර්ෂයේ නයාරු, නන්දිකඩාල්, ආරුගම්බේ, ලංකා පටුන, මුන්දලම හා රූකව යන කලපු ගැඹුරු කිරීම හා පිරිසිදු කිරීම වෙනුවෙන් රු.මිලියන 335.37 ක් වෙන්කර තිබුණි. වර්ෂය අවසානයේ සියයට 5.9 කට සමාන රු.මිලියන 23.49 ක් පමණක් වැයකර තිබුණි.

(ii) බලපිටිය ධීවර වරාය ඉදිකිරීම් සඳහා 2021 වර්ෂයේ රු.මිලියන 300 ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණ ද එයින් රු.මිලියන 255 ක් හා රු.මිලියන 43 ක් පිළිවෙලින් වෙල්ලමංකර ධීවර වරායේ හා කලමැටිය ධීවර වරායේ වැඩිදියුණු කිරීමේ කටයුතු සඳහා වෙන්කරගෙන තිබුණි. බලපිටිය ධීවර වරායේ ඉදිකිරීම් ව්‍යාපෘතිය සඳහා වියදම රු.1,030,216 ක් වූ අතර මුල් ප්‍රතිපාදනය හා සැසඳීමේ දී සියයට 0.34 ක මූල්‍ය ප්‍රගතියක් පමණක් ලබා තිබුණි. ඒ අනුව අපේක්ෂිත කාර්යයන් ඉටුකර නොතිබුණු හෙයින් භෞතික ප්‍රගතිය ද මන්දගාමී විය.

(iii) මීගමුව කලපුව සංවර්ධනය කිරීම යටතේ අලුත් ජැටි පහසුකමක් ඉදිකිරීම වෙනුවෙන් රු.මිලියන 145 ක ප්‍රතිපාදනයක් සලසා ගෙන තිබුණ ද මුදල් රෙගුලාසි 66 මාරු කිරීම් අනුව රු.71,500,000 ක් වෙනත් සංවර්ධන ව්‍යාපෘතිවලට මාරුකර තිබුණි. ඒ අනුව ශුද්ධ ව්‍යාපෘති ප්‍රතිපාදනය රු.73,500,000 ක්වූ අතර ව්‍යාපෘති වියදම රු.11,095,602 ක් ලෙස දක්වා තිබුණි. තව ද අමාත්‍යාංශය පවත්වාගෙන තිබුණු වැය ලෙජරය අනුව එම ව්‍යාපෘති කටයුතු සඳහා කිසිදු මුදලක් වැයකළ බවට තොරතුරු ලෙජරයේ සටහන් කර නොතිබූ අතර ක්‍රියාකාරී සැලැස්ම මත පිළියෙල කරන ලද ප්‍රගති වාර්තාව අනුව ද භෞතික ප්‍රගතිය ශූන්‍ය අගයක් ලෙස දක්වා තිබුණි.

(ආ) වැය විෂයයන් 03 ක් සඳහා මුදල් රෙගුලාසි 66 යටතේ මාරු කරගන්නා ලද රු.169,500,000 ක ප්‍රතිපාදනවලින් වර්ෂය තුළ දී රු.20,652,381 ක් පමණක් වැයකර තිබුණෙන් රු.148,847,619 ක ඉතිරියක් වූ අතර මුදල් රෙගුලාසි මාරුකිරීම යටතේ ප්‍රතිපාදනය හා සැසඳීමේ දී ඉතිරියේ ප්‍රතිශතය සියයට 88 ක් විය.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් ද කරනු ලැබේ.

(i) ඉකුත් වර්ෂවල සිට කළමැටිය ධීවර වරාය ඉදිකිරීම් ව්‍යාපෘතිය යටතේ ඉදිකිරීම් ක්‍රියාත්මක වී තිබුණ ද ඒ සඳහා මූලික වියදම් ඇස්තමේන්තුවක් සිදුකර ගැනීමට කටයුතු නොකර සමාලෝචිත වර්ෂයේ බලපිටිය ධීවර වරාය ඉදිකිරීම් ව්‍යාපෘති ප්‍රතිපාදනවලින් මුදල් රෙගුලාසි මාරුකිරීම් යටතේ වෙන්කර වියදම් ඇස්තමේන්තු තාත්විකව සිදුකර නොතිබුණි.

(ii) මූලික විමර්ශනය හා ශක්‍යතා අධ්‍යයන වැය විෂයය යටතේ රු.8,177,173 ක් වැය කර තිබුණ ද ඊට අදාල ගෙවීම් වවුචර්, ගෙවූ මුදල ආදී විස්තර විගණනයට ඉදිරිපත් නොවීය.

(iii) තව ද උක්ත වැය විෂයය යටතේ වූ රු.8,322,827 ක ඉතිරියෙන් රු.6,500,000 ක ඉතිරිය සම්පූර්ණයෙන්ම මුදල් රෙගුලාසි මාරුකිරීමක් විය.

(ඇ) රු.4,177,250,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදන මුදලින් සියයට 24.3 කට සමාන රු.1,019,145,349 ක් ඉතිරි වී තිබුණු අතර එයින් ද වැය විෂයයන් 11 ක සියයට 53 සිට සියයට 96 දක්වා පරාසයක රු.239,264,700 ක ප්‍රතිපාදන ඉතිරිවීම් ද වැය විෂයයන් දෙකක රු.7,300,000 ක සියයට 100 ක ඉතිරිවීම් ද තිබුණු බව නිරීක්ෂණය විය.

(ඈ) මූලික වියදම් ඇස්තමේන්තුව හා සංශෝධිත වියදම් ඇස්තමේන්තුව අතර විචලතාව පෙන්නුම් කරන ඒසිඒ 2(iii) ප්‍රකාශය තුළින් අමාත්‍ය කාර්යාල ව්‍යාපෘතියේ වැය විෂයය ප්‍රතිපාදන හා අමාත්‍යාංශ පරිපාලන ව්‍යාපෘතියේ වැය විෂයය ප්‍රතිපාදන එකතුකර දැක්වීම හේතුවෙන් ශුද්ධ ප්‍රතිපාදනය හා වියදම් විචලතාව නිවැරදිව හෙළිදරව් වී නොතිබුණි.

(ඉ) ධීවර අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශනයේ ACA-2(ii) අනුව අංක 2202 දරන සංවර්ධන සහායන් යටතේ ප්‍රාග්ධන මාරුකිරීම් වශයෙන් අංක 151-02-03-56-2202 දරන වැය විෂයය වන ඔරුවැල්ල පුවත්පත සහ ධීවර නවෝදය ගුවන් විදුලි වැඩසටහන යටතේ 2021 වර්ෂය සඳහා රු.5,000,000 ක මූලික වියදම් ඇස්තමේන්තුව මුදල් රෙගුලාසි 66 මඟින් රු.5,610,000 කින් එනම් සියයට 112.2 කින් වැඩිකරගෙන ශුද්ධ ප්‍රතිපාදනය රු.10,610,000 ක් ලෙස අංක 151-2-3-02-2202 දරන ප්‍රාග්ධන මාරුකිරීම් යටතේ එක් වැය විෂයයක් ලෙස පෙන්වා තිබීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශයේ ACA-2(iii) ප්‍රකාශයට අනුව මූලික සහ සංශෝධිත වියදම් ඇස්තමේන්තු අතර විචලතාව පැහැදිලි කිරීමේ දී සියයට 112.2 ක්වූ විචලතාවය, ප්‍රතිශතයක් ලෙස හෝ වෙනසට හේතු හෝ ඉදිරිපත් කිරීමට නොහැකි වී තිබුණි.

(ඊ) ධීවර අමාත්‍යාංශය විසින් 2021 වර්ෂයේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් නාරා ආයතනය වෙත 2021 ජූලි මාසයේ දී රු.15,378,000 ක්ද දෙසැම්බර් මාසයේ දී රු.4,900,000 ක්ද වශයෙන් රු.20,278,000 ක් ලබා දී තිබුණු අතර 2021 වර්ෂයේ දී රු.12,042,841 ක් වැය කර තිබුණි. ජූලි මාසයේ දී ලබා දී තිබුණු රු.15,378,000 ක මුදල මාස 5 ක් ගතවීමෙන් පසුව ද සම්පූර්ණයෙන් උපයෝජනය කර නොතිබුණු බවත් වැය කළ මුදලට අදාල වියදම් විස්තර ඉදිරිපත් කර නොතිබිය දී කාර්යක්ෂමතාව ඇගයීම් නොකර රු.4,900,000 ක් අවශ්‍යතාවයක් නොමැතිව නැවත නාරා ආයතනයට ලබා දී ඇති බවත් විගණනයේ දී නිරීක්ෂණය විය.

(උ) 2020 දෙසැම්බර් 31 දිනැති අංක 07/2020 දරන අයවැය චක්‍රලේඛයේ 07 ඡේදය අනුව මුදල් රෙගුලාසි 66 හා 69 යටතේ ප්‍රතිපාදන මාරු කිරීමේ දී පුනරාවර්තන වියදම් යටතේ වන වැය විෂයයන් අතර අමාත්‍යාංශ ලේකම්වරයා විසින් කරන ලද මාරු කිරීම්වලට අදාල ප්‍රතිපාදන පිළිබඳ විස්තරාත්මක වාර්තා මුදල් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පෙර ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත එවිය යුතු බව දැක්වුවත් ලේකම්වරයා විසින් කරන ලද මාරුකිරීම් අවස්ථා 8 ක් සම්බන්ධයෙන් ධීවර අමාත්‍යාංශය විසින් එවැනි වාර්තාවක් ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ බවට තොරතුරු ඉදිරිපත් නොවිය.

(ඌ) මුදල් රෙගුලාසි 12(1) ඡේදය අනුව මූලධන වියදම් ඇස්තමේන්තු කිරීමේ දී මූලධන වත්කම් පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාවය සම්පූර්ණයෙන් පැහැදිලි කළ යුතුය යන්න සඳහන් වුවත් 2021 වර්ෂය සඳහා 2001 වැය විෂයය යටතේ මූලධන වත්කම් පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීමේ වියදමක් ඇස්තමේන්තු කර නොතිබිය දී 2021 වර්ෂය තුළ අමාත්‍යාංශයේ ප්‍රධාන පිවිසුම් දොරටුව අලුත්වැඩියාව වෙනුවෙන් වූ කොන්ත්‍රාත්තුවක් සඳහා රු.15,300,601 ක් ගෙවා තිබුණි.

(එ) එසේම මුදල් රෙගුලාසි 138(1) ප්‍රකාරව වවුවර් සහතික කිරීමේ දී එහි සඳහන් වැඩසටහන, ව්‍යාපෘතිය, ව්‍යාපෘති පංතිය යනාදියට නිවැරදි වැය භාරයක් වන බව සහතික කළ යුතු වුවත් මෙම රු.15,300,601 ක්වූ පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීමේ වියදම මූලධන වත්කම් අත්පත් කරගැනීම යටතේ ගොඩනැගිලි හා ඉදිකිරීම් ප්‍රතිපාදන අංක 151-1-2-0-2104 දරන වැය විෂයය යටතේ මූල්‍ය ප්‍රකාශනයේ පෙන්නුම් කර තිබුණි.

(ඒ) හික්කඩුව ධීවර නිවාස සංකීර්ණය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ධීවර අමාත්‍යාංශය විසින් රු.මිලියන 39.012 ක ප්‍රතිපාදන ලබාදීම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) හික්කඩුව ධීවර නිවාස සංකීර්ණය ප්‍රතිසංස්කරණය කිරීම ධීවර අමාත්‍යාංශයේ 2021 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් කර නොතිබුණි.

(ii) හික්කඩුව ධීවර නිවාස සංකීර්ණය ධීවර අමාත්‍යාංශය සතු වත්කමක් ලෙස ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් දක්වා තිබුණත් එය ධීවර අමාත්‍යාංශය සතු වත්කමක් ද නැද්ද යන්න පිළිබඳ සලකා බලා නොතිබීම හා කලපු සංරක්ෂණය හා සංවර්ධනය කිරීමේ ප්‍රතිපාදනවලින් එම වියදම් දරා තිබූ බැවින් කලපු සංරක්ෂණ හා සංවර්ධනය කිරීමේ අරමුණ ද ඉටු වී නොතිබුණි.

(iii) 2021 දෙසැම්බර් 23 දිනට ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය, කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය විසින් එවන ලද මූල්‍ය හා භෞතික ප්‍රගති විස්තර අනුව මූල්‍ය ප්‍රගතිය සියයට 14 කට සමාන රු.මිලියන 5.5 ක් බවත් භෞතික ප්‍රගතිය සියයට 20 ක් බවත් 2021 වසර අවසන් වන විට වැඩ නිම කිරීමට සැලසුම් කර ඇති බවත් දක්වා තිබුණ ද 2021 දෙසැම්බර් 31 දිනවන විට මූල්‍ය ප්‍රගතිය සියයට 22 ක් පමණක් වූ අතර භෞතික ප්‍රගතිය සියයට සියයක් ලෙස සංවර්ධනය කිරීමේ ප්‍රගතිය විගණනයට අනාවරණය නොවීය.

2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

මූල්‍ය ප්‍රකාශනයේ 2021 දෙසැම්බර් 31 දිනට සටහන (iii) බැදීම් හා බැරකම් ප්‍රකාශයේ බැරකම් එකතුව රු.226,496,035 ක් වුවද මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබුණු භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත SA-92 වාර්තාවේ බැදීම් හා බැරකම් එකතුව රු.227,727,740 ක් විය. ඒ අනුව රු.1,231,705 ක වෙනසක් නිරීක්ෂණය විය. එහෙත් නිරීක්ෂණය වූ එම වෙනසට හේතු අනාවරණය කරගෙන නොතිබුණි.

2.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරි සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 3.1.4 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී නොතිබුණි.

2.4 බැංකු ගිණුම් මෙහෙයවීම

ධීවර අමාත්‍යාංශයේ සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශනයේ සටහන (viii) ට අනුව උතුරු පළාත් තිරසර ධීවර සංවර්ධන ව්‍යාපෘති බැංකු ගිණුම් අංක 7040777 යටතේ 2021 දෙසැම්බර් 31 දිනට ශේෂය ද බැංකු ප්‍රකාශයට අනුව එදිනට බැංකු ශේෂය ද රු.48,700 ක් වී තිබුණි.

මේ සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) ධීවර අමාත්‍යාංශය විසින් ධීවර වරාය, නැංගුරම්පොළ හා ගොඩබෑමේ ස්ථාන සංවර්ධනය හා ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් පවත්වාගෙන ගොස් තිබුණු බැංකු ගිණුමට 2021 පෙබරවාරි මාසයේ දී රු.391,655,000 ක මුදල් මාරු කර තිබුණු අතර ව්‍යාපෘති බැංකු ගිණුමට අදාල 2021 පෙබරවාරි මාසයේ බැංකු ප්‍රකාශයට අනුව ලැබීම් ද පහත දැක්වේ. එහෙත් මුදල් රෙගුලාසි 395(ඇ) ප්‍රකාරව බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සුදානම්ව තිබිය යුතු වුවත් 2021 වර්ෂයේ මාර්තු සිට 2021 නොවැම්බර් දක්වා ව්‍යාපෘති බැංකු ගිණුමට අදාල බැංකු ප්‍රකාශ හා බැංකු සැසඳුම් ප්‍රකාශ විගණනයට ඉදිරිපත් නොවිය.

දිනය	ලැබීම්
	රු.
2021.02.05	1,620,000
2021.02.11	386,035,000
2021.02.23	4,000,000
	391,655,000

(ආ) රාජ්‍ය අමාත්‍යාංශය විසින් 2020 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කළ යුතුව තිබුණු රු.2,908,690 ක මුදල ප්‍රේෂණය නොකර ව්‍යාපෘති බැංකු ගිණුම වෙත වෙක්පත් තුනක් යටතේ නිකුත්කර තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 සැලැසුම් කිරීම

(අ) ධීවර අමාත්‍යාංශයේ 2021 වර්ෂය සඳහා වූ ඇස්තමේන්තුව මඟින් සුවිශේෂී ප්‍රමුඛතා කාර්යයන් 9 ක් හඳුන්වා දී තිබුණ ද 2021 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මට හා ඒ අනුව පිළියෙල කළ ප්‍රගති වාර්තාවට අනුව ධීවර ප්‍රජාවගේ සුභසාධන කටයුතු පුළුල් කිරීම, ධීවර වරාය නවීකරණය කිරීම සහ අවශ්‍යතාවය මත ධීවර වරාය ඉදිකිරීම වෙනුවෙන් හැර අනෙකුත් පහත සඳහන් කාර්යයන් කෙරෙහි අවධානය යොමුකර සැලසුම් සකස් කර නොතිබුණු අතර උතුරු හා නැගෙනහිර මුහුදේ අනවසරයෙන් මසුන් ඇල්ලීම තුරන් කිරීම සහ නාවික හා වෙරළාරක්ෂක ඒකක ශක්තිමත් කිරීම හා ඉන්දියාව සමඟ ගැටුම් නිරාකරණය කිරීමේ කාර්යය වෙනුවෙන් ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර ඒකාබද්ධ ක්‍රියාකාරී කමිටුවක් පිහිටුවා තීරණ කිහිපයක් ක්‍රියාත්මක කිරීමට පමණක් කටයුතු කර තිබුණි.

- වෙරළබඩ ප්‍රදේශවල මත්ස්‍ය ගහනය ඉහළ නැංවීම සඳහා විද්‍යාත්මක ක්‍රමවේදයක් හඳුන්වාදීම.
- අන්තර්ජාතික මුහුදු ප්‍රදේශයේ මසුන් ඇල්ලීම පුළුල් කිරීම සඳහා දේශීය සමාගම්වලට අවස්ථාව ලබාදීම.
- ටින් මාළු කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා පෞද්ගලික සමාගම් සහ ආයෝජකයින් දිරිගැන්වීම.
- නිෂ්පාදකයාට සහ පාරිභෝගිකයාට ද සාධාරණය ඉටුවන ආකාරයට මත්ස්‍ය නිෂ්පාදනය සඳහා අලෙවි සංවර්ධන කටයුතු පුළුල් කිරීම.
- උතුරු හා නැගෙනහිර මුහුදේ අනවසරයෙන් මසුන් ඇල්ලීම තුරන් කිරීම සහ නාවික හා වෙරළාරක්ෂක ඒකක ශක්තිමත් කිරීම හා ඉන්දියාව සමඟ ගැටුම් නිරාකරණය කිරීම.
- ධීවර ප්‍රජාව සඳහා ඵලදායී බැංකු හා රක්ෂණ ක්‍රමයක් හඳුන්වාදීම.
- සාගර විශ්ව විද්‍යාලය භාවිතාකර තරුණ තරුණියන් සඳහා ධීවර කටයුතු පිළිබඳ තාක්ෂණික හා කළමනාකරණ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

(ආ) සංවර්ධන සහායන් යටතේ ප්‍රාග්ධන මාරුකිරීම් වැය විෂයය යටතේ ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය ට්‍රැක් යන්ත්‍ර 110 ක් මිලදී ගැනීමට රු.8,514,000 ක් වැයකළ බව දක්වා තිබුණු නමුත් 2021 ක්‍රියාකාරී සැලැස්ම අනුව එවැනි මිලදී ගැනීමකට ප්‍රතිපාදන සලසා නොතිබූ බව නිරීක්ෂණය විය.

(ඇ) ප්‍රාග්ධන මාරුකිරීම් යටතේ නව තාක්ෂණය හඳුන්වාදීමේ වැය විෂයය මගින් නාරා ආයතනය රු.10,130,187 ක් වැය කර තිබුණ ද ක්‍රියාකාරී සැලැස්මට අනුව නව තාක්ෂණය හඳුන්වාදීම මගින් මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීමට හා මසුන් නිෂ්පාදනයට වැය වන ගමන් කාලය අඩු කිරීමට හඳුන්වා දුන් තාක්ෂණ ක්‍රම පිළිබඳ විස්තර කිසිවක් විගණනයට ඉදිරිපත් නොවීය.

3.1.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

වැය ලෙජරය පරීක්ෂාවේ දී අංක 151-02-03-02-2202 දරන වැය විෂයය යටතේ ප්‍රතිපාදනය රු.60,000,000 ක් සහ වියදම රු.39,236,546 ක් ලෙස දක්වා තිබුණ ද රු.10,000,000 ක් වෙන්කර තිබුණු මත්ස්‍ය බීම් සොයාගැනීම සඳහා මෘදුකාංගයක් සැපයීමේ කාර්යය පමණක් රු.6,500,000 ක වියදමක් දරා ඉටුකර තිබුණි. 2021 වර්ෂය තුල අමාත්‍යාංශය සැලසුම් කරන ලද ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව සහ නාරා ආයතනය මගින් ක්‍රියාත්මක කළ යුතුව තිබුණු වෙරලාසන්න ධීවර මත්ස්‍ය බීම් 10 ක් සඳහා FAD සවිකිරීම්, පරිසර හිතකාමී අඩු ඉන්ධන, විකල්ප ඉන්ධන බලශක්ති සහිතව වැඩිදියුණු කළ යාත්‍රාවක් හඳුන්වාදීම, හීන වූ මත්ස්‍ය ගහනය ඉහළ නැංවීමට මසුන් තැන්පත් කිරීම සඳහා මසුන් වර්ග හා ප්‍රමාණයන් හඳුනාගැනීමේ පර්යේෂණ කටයුතු, වෙරළාශ්‍රිත මුහුදු තීරයේ මත්ස්‍ය ගහනය වැඩිකිරීම සඳහා අබලි වාහන භාවිතා කර ඇටවුම් යෙදවීම වැනි ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොතිබුණි.

3.1.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කළ යුතුව තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශක්‍යතා හා විමර්ශන නමින් සඳහන් වූ වැය විෂයයේ ප්‍රතිපාදන මුදල රු.මිලියන 16.5 ක් ලෙස දක්වනු වෙනුවට වැය ඇස්තමේන්තුවේ සඳහන් නොවන "වෙරළ පුනරුත්ථාපනය හා සම්පත් කළමනාකරණ වැඩසටහන (FSDD) යටතේ එම මුදල දක්වා තිබුණි.

(ආ) තව ද 2021 වැය ඇස්තමේන්තු යටතේ දක්වා නොතිබුණු විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු වශයෙන් අමාත්‍යාංශ උතුරු පළාත් තිරසර ධීවර ව්‍යාපෘතිය නමින් තොරතුරු ඡේද අංක 1.7 යටතේ අන්තර්ගත කර තිබුණි.

3.2 විගණන විමසුම්වලට පිළිතුරු ලබානොදීම

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ (ඉ) උපවගන්තිය ප්‍රකාරව විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියලු විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදුකළ යුතු වුවත් 2019, 2020 හා 2021 වර්ෂවල නිකුත් කර තිබුණු විගණන විමසුම් 6 කට පිළිතුරු ලබා දී නොතිබුණි.

3.3 කළමනාකරණ දුර්වලතා

(අ) කලපු 10 ක් හා වැව් 100 ක් සංවර්ධන කිරීමේ වැඩසටහන වෙනුවෙන් 2018 වර්ෂය සඳහා අමාත්‍යාංශය වෙත වෙන්කර තිබූ රු.මිලියන 1000 ක මුදලින් යන්ත්‍ර 03 ක් මිලට ගැනීම සඳහා රු.මිලියන 180 ක් ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය වෙත ලබා දී ඊට අදාලව සැපයුම්කරුවකු තෝරාගෙන ඒ සඳහා 2018 ජූලි 17 දින රු.42,572,925 ක සංචලන අත්තිකාරම් මුදලක් ගෙවා තිබුණි. එම සංචලන අත්තිකාරමට අදාලව ලබා දී තිබුණු අත්තිකාරම් සුරක්ෂණය ව්‍යාජ ලෙස සකස් කළ එකක් බව මාස 6 කට පසුව හඳුනාගෙන අදාල අත්තිකාරම් මුදල ආපසු අයකරගෙන තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ .

(i) අවම මිලගණන් ඉදිරිපත් කරන ලද ලංසුකරුගේ ලංසුව කිසිම සාධාරණ හේතුවක් නොමැතිව ප්‍රතික්ෂේපකර ඊට පරිබාහිර අයකු තෝරාගෙන ලංසු ප්‍රදානය කර තිබුණද අදාල යන්ත්‍ර ලැබී නොතිබුණු හෙයින් අමාත්‍යාංශය විසින් ඉලක්ක කරන ලද කාර්යභාරය වර්ෂ 4 ක් ගතව ඇතත් ඉටුකර ගැනීමට නොහැකිවී තිබුණි.

(ii) 2018 ජූලි 03 දිනැති අංක 152/2018 දරන අත්තිකාරම් ගෙවීම් සහතිකයේ නිරවද්‍යතාවය අත්තිකාරම් මුදල ගෙවීමට පෙර තහවුරු කරගත යුතු වුවත් මාස 06 ක් ප්‍රමාද කර තිබුනු බැවින් ව්‍යාජ සහතිකයක් බව හඳුනාගැනීමට නොහැකි වී තිබුණි.

(iii) යන්ත්‍ර 03 ක් මිලදීගැනීම සඳහා සැපයුම්කරු විසින් ව්‍යාජ අත්තිකාරම් සුරක්ෂණ ඉදිරිපත් කර වංචනිකව රජයේ මුදල් අවභාවිතා කිරීමට කටයුතු කිරීම සම්බන්ධයෙන් අදාල නිලධාරීන්ට හෝ සැපයුම්කරුට එරෙහිව කිසිදු නීතිමය පියවරක් ගෙන නොතිබුණු අතර මුදල් රෙගුලාසි 705 ප්‍රකාරව සැපයුම්කරු අසාදු ලේඛනගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(iv) අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස්, ප්‍රසම්පාදන උපදෙස් හා මුදල් රෙගුලාසි හා නීතිපති ලබා දී ඇති උපදෙස් අනුව ඊට අදාළ ගිවිසුම සකස් කර නොතිබීම නිසා අදාල සැපයුම්කරුට එරෙහිව නීතිමය කටයුතු කිරීමට හැකියාව ලැබී නොතිබුණි.

(v) අමාත්‍යාංශයේ හා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා ද ඇතුලුව නිලධාරීන් 4 දෙනෙකු උක්ත උපකරණයේ ව්‍යුහගත සැලසුම්, භාවිතා කළ අමුද්‍රව්‍ය, අමතර කොටස් සහ එංජිම ආදී කරුණු පරීක්ෂා කිරීමට ඇමරිකා එක්සත් ජනපදයේ විදේශීය සංචාරයකට සහභාගි වීම වෙනුවෙන් රු.435,499 ක් ගෙවා තිබුණ ද අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබුණි.

(vi) ලංසු ලේඛනවල පොදු කොන්දේසි 1.2 ප්‍රකාරව උපකරණය නියමිත ප්‍රමිතියට නිපදවා තිබෙන බවත් නවතම නිර්මාණයක්වීමත් සහතික විය යුතු වුවත් තෝරාගනු ලැබූ ආයතනය ඉදිරිපත් කළ Ultra Tex WH 120 උපකරණය මැලේසියාවේ නිෂ්පාදනයක් බව දක්වා තිබුණි. එහෙත් මැලේසියාවේ එම ආයතනයේ වෙබ් අඩවියට අනුව එවැනි උපකරණයක් නිෂ්පාදනය නොකරන බවත් එය ඇමරිකානු තාක්ෂණය අනුව නිෂ්පාදනය කරන ලද උපකරණයක් මැලේසියාවේ එකලස් කර නිෂ්පාදනය කරන බවත් නිරීක්ෂණය විය. ඒ අනුව ලංසු කොන්දේසිවලට පටහැනිව මෙම යන්ත්‍ර මිලටගැනීමට ලංසුකරු තෝරාගෙන තිබුණි.

(vii) උක්ත මිලදී ගැනීම සම්බන්ධයෙන් ප්‍රසම්පාදන අස්ථිත්වය ලෙස ක්‍රියාකරන ආයතනය විසින් ත්‍රෛයිමාසික ප්‍රගතිය පිළිබඳ වාර්තාවක් ලබාදෙන ලෙස දක්වා තිබුණ ද ඒ සම්බන්ධව කිසිදු වාර්තාවක් වසර 3 ක් ගතව ඇතත් ලබා දී නොතිබීම සම්බන්ධයෙන් පසුවිපරම් සිදුකර නොතිබුණි.

(viii) ප්‍රසම්පාදන කමිටුව පත් කිරීමට අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉල්ලීම් කළ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයා විසින් තමාගේ නම ද එකී කමිටුවට ඇතුළත් කර අනුමැතිය ඉල්ලා තිබුණු අතර කමිටු සාමාජිකයකු ලෙස අමාත්‍යාංශ ලේකම් විසින් අනුමැතිය ලබා දී තිබුණි .තවද ප්‍රසම්පාදන කාර්යය සංග්‍රහයේ 2.7.4 ඡේදයට අනුව ප්‍රසම්පාදන කමිටුව සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත විය යුතු වුවත් උක්ත නිලධාරියා ද ඇතුලුව අමාත්‍යාංශයේ තවත් නිලධාරියකු සාමාජික තත්ත්වයෙන් පත් කර තිබීම හේතුවෙන් ප්‍රසම්පාදන තීරණයේ විනිවිදභාවයට බලපෑමක් වී තිබුණි.

එච්.එන්.රණතුංග
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති

විගණකාධිපති වෙනුවට.

04 - කාර්ය සාධන දර්ශක

4.1. ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම			
	100% - 90%	**75% - 89%**	**50% - 74%**	
2021 වර්ෂයේදී සමස්ත මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 4,36,910 කින් වැඩිකිරීම	√			$\frac{436,910}{482,420}$ X 100 = 90.56
මත්ස්‍ය අපනයන ප්‍රමාණය 2021 (මෙට්‍රික් ටොන්)	√			$\frac{26,749}{27,500}$ X 100= 97.27

05 - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු .

ඉලක්ක / අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය			
			0% - 49%	50%- 74%	75%- 100%	
තිරසාර සංවර්ධන ඉලක්කය 14	2021 දී සමුද්‍ර මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 372,470 කි	මෙ.ටො 331,675			√	$\frac{331,675}{372,470}$ X 100 = 89
තිරසර සංවර්ධන ඉලක්ක 12	2021 දී දේශීය ජලජීවී වගා මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 109,950 කි	මෙ.ටො. 104,235			√	$\frac{104,235}{109,950}$ X 100 = 94.8
	2021 දී මත්ස්‍ය අපනයනය මෙට්‍රික් ටොන් 27,500	මෙ.ටො 26,749			√	$\frac{26,749}{27,500}$ X 100 = 97.2

5.2 ක්ෂේත්‍රයේ තිරසාර සංවර්ධන ඉලක්ක ලඟා කර ගැනීම

2022 වසර වන විට ඉලක්ක 14.6, අධික ධාරිතාව, අධික ලෙස මසුන් ඇල්ලීමට දායක වන විවිධාකාරයේ ධීවර සහනාධාර තහනම් කිරීම, නීති විරෝධී, වාර්ථා නොවූ හා නියාමනය නොවන මසුන් ඇල්ලීම සඳහා සහනාධාර ඉවත් කිරීම හා එබඳු නව සහනාධාර හඳුන්වා දීමෙන් වැළකීම, ලෝක වෙළඳ සංවිධානයේ ධීවර සහනාධාර සාකච්ඡා වලදී සංවර්ධිත හා උණන සංවර්ධිත රාජ්‍යයන් විශේෂ හා වෙනස් කොට සැලකීම සම්බන්ධව සුදුසු සහ ඵලදායී පියවර හඳුනා ගැනීම. දර්ශකය 14.6.1 -නීති විරෝධී, වාර්තා නොවූ සහ නියාමනය නොවූ මසුන් ඇල්ලීම හා සම්බන්ධව අන්තර්ජාතික, නීත්‍යානුකූල ලේඛන ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාණය (බලධාරී දර්ශකය)

ඉන්දියානු සාගර ටූනා කොමිසමට අදාල නීති හා ගිවිසුම් සම්බන්ධව ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තය අනුකූලතාවය දක්වන ප්‍රමාණය

වර්ෂය	අනුකූලතා අනුපාතය
2010	5%
2011	18%
2012	47%
2013	51%
2014	60%
2015	74%
2016	77%
2017	82%
2018	87%
2019	90%
2020	93%
2021	95%



5.2.1 2030 වන විට ඉලක්ක 14.7.1 - ධීවර ජලජීවී වගා සහ සංචාරක ක්ෂේත්‍රය තිරසාර ලෙස කළමනාකරණය කිරීම ඇතුළුව සාගර සම්පත් තිරසාර ලෙස භාවිත කිරීම තුළින් ආර්ථික ප්‍රතිලාභ වැඩිකිරීම. 14.7.1 දර්ශකය - දියුණු වෙමින් පවතින කුඩා දූපත් රාජ්‍යයන්, ඌන සංවර්ධිත රටවල් සහ සියළුම රටවල් වල ධීවර කර්මාන්තය දළ ජාතික නිෂ්පාදනයෙහි අනුපාතයක් ලෙස පහත දැක්වේ.

විස්තරය	අංකනය	වටිනාකම්	ඒකක මිලියන	වර්ෂය
දළ දේශීය නිෂ්පාදිතය	දළ දේශීය නිෂ්පාදිතය	11,943,654	රු. මිලියන	2021
සාගරයේ මසුන් ඇල්ලීම සහ සාගර ජලජ ජීවී වගාව		99,679	රු. මිලියන	2021
මිරිදිය මසුන් ඇල්ලීම සහ සාගර ජලජ ජීවී වගාව		24,724	රු. මිලියන	2021
එකතු කල අගයෙන් යුතු ධීවර හා ජලජ සම්පත්	VA FIA	124,403	රු. මිලියන	2021
ධීවර හා ජලජ සම්පත් අංශයේ දළ දේශීය නිෂ්පාදනය	GDP FIA VA FIA/ GDP	1.0	ප්‍රතිශතය	2021
සාගරයෙන් අල්ලා ගත් මසුන් ප්‍රතිශතය සඳහා අගය එකතු කිරීම	VA = GDP *Q_M / Q_T	0.76	ප්‍රතිශතය	2021

මූලාශ්‍රය - ධීවර අමාත්‍යාංශයේ ජන හා සංඛ්‍යාලේඛණ අංශය 2020

5.2.2 2022 වසර වන විට 14.4 අස්වනු නෙලීම සහ අධික ලෙස මසුන් ඇල්ලීම අවසන් කිරීම, නීති විරෝධී, වාර්ථා නොවන සහ නියාමනය නොවන මසුන් ඇල්ලීම සහ විනාශකාරී මසුන් ඇල්ලීම ඵලදායි ලෙස නියාමනය කිරීම සහ ඔවුන්ගේ ජීව විද්‍යාත්මක අංග ලක්ෂණ අනුව උපරිම තිරසාර අස්වැන්නක් අවම වශයෙන් තීරණය වන මට්ටමට කෙටිම ශක්‍යතා කාල පරාසයක් තුල නැවත ප්‍රතිස්ථාපනය කිරීම පිණිස විද්‍යාව පදනම් කරගත් කළමණාකරන සැලසුම් ක්‍රියාත්මක කිරීම.

14.4.1 දර්ශකය- ජීව විද්‍යාත්මක තිරසාර මට්ටමකට මත්ස්‍ය තොග සමානුපාත කිරීම

ශ්‍රී ලංකාවේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ පොකිරිස්සන් (Panulirus Homarus) තොග තක්සේරු කිරීමේ ප්‍රතිඵල අනුව ඔවුන්ගේ බිජු ලෑමේ හැකියා අනුපාතයේ සමතුලිතතාව (2021 අවසානය අනුව පහත දැක්වේ)

වර්ෂය	බිජු ලෑමේ හැකියාව
2007	22% (20%-24%)
2014	18% (15%-22%)
2015	17% (15%-19%)
2017	20% (19%-21%)
2018	27% (24%-31%)
2019	21%(20%-23%)
2020	27% (23%-31%)

සාම්ප්‍රධායික යොමුගත ස්ථානය	බිජු ලෑමේ හැකියාවේ ආසන්නතාවය
පෙර සුදානම SPR	60%
පෙර සූදානම උපරිම තිරසාර ආර්ථික අස්වැන්න	50%
ඉහළ ඉලක්ක යොමුගත ස්ථානය (උපරිම තිරසාර අස්වැන්න MSY)	40%
පහළ ඉලක්ක යොමුගත ස්ථානය (උපරිම තිරසාර අස්වැන්න MSY)	30%
සීමා යොමුගත ස්ථානය (LRP)	20%

මූලාශ්‍රය - සංඛ්‍යාලේඛන අංශය ධීවර අමාත්‍යාංශය (2021)

ධ්වනි ක්‍රමවේද මගින් තක්සේරු කරන ලද සමුද්‍රීය මත්ස්‍යයන්ගේ ජෛව ස්කන්ධය

වෙරළ කලාපය	වර්ෂය	කුඩා සමුද්‍ර මත්ස්‍යයන්ගේ ජෛව ස්කන්ධය PEL1 (මෙට්‍රික් ටොන්)	මධ්‍යම ප්‍රමාණයේ මත්ස්‍යයන්ගේ ජෛව ස්කන්ධයPEL2 (මෙට්‍රික් ටොන්)
ගිනිකොණ	2019	164.0	7281.0
ගිනිකොණ	2020	2240.2	2271.3

5.3 .තිරසාර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීමට ඇති අභියෝග හා පරතර

ඉන්දියානු සාගරයේ කාර්ය බහුල මුහුදු මාර්ගවල මුහුදු ක්‍රියාකාරකම් ඉහළ යාම් වලට දිවයිනේ සාගර හා වෙරළ පද්ධති නිරාවරනය වෙමින් පවතී. මීට සමගාමීව ශ්‍රී ලංකාවේ ‘‘නීළ ආර්ථිකයක්’’ අත්පත් කරගැනීමේ ප්‍රයත්නය ආතතියේ බලපෑමට හසුවී ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන් සාගර ජීව විද්‍යා තිරසාර කළමනාකරණයට බලපෑමක් විය හැකි පරතර සහ අභියෝග පැන නැගිය හැකි අතර ඉන් වඩාත්ම තීරණාත්මක ලෙස සැලකෙන දෑ පහත ලැයිස්තු ගත කොට ඇත.

හානිකර බොටම් ට්‍රෝලින් පන්න ක්‍රම යොදාගෙන ඉන්දියානු ධීවරයින් විසින් ශ්‍රී ලංකාවේ ජල තීරය තුල නීති විරෝධී මසුන් ඇල්ලීම ධීවර කර්මාන්තයේ තිරසාරභාවයට ප්‍රධාන අභියෝගයකි. මෙම තත්වය රටේ නාවික හමුදාවටද මැඩ පැවැත්විය නොහැකි අසීරු පරිමාණයේ ගැටළුවක් බවට වර්ධනය වී ඇත. නීති විරෝධී මසුන් මරන්නන් අඛණ්ඩව රාජ්‍ය තාන්ත්‍රික උත්සාහයන් සහ නීතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදයන් නොතකමින් කටයුතු කරයි.

නීත්‍යානුකූල නොවන, වාර්තා නොවූ, නියාමනය නොවූ ධීවර මෙහෙයුම් සිදු කිරීම මඟින් දේශීය ධීවර කර්මාන්තයට සැලකිය යුතු හානියක් සිදු කළ හැක. අනෙක් අතට . සම්පත් අතින් සලකන විට එය හානිකර බලපෑමකි. එය මසුන් අපනයනය කිරීමේ කර්මාන්තයට අගතිදායක ලෙස බලපෑ හැකිය. වරක් ශ්‍රී ලංකාව නීත්‍යානුකූල නොවන, වාර්ථා නොවූ හා නියාමනය නොවූ ධීවර කටයුතු සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග නොගනිමින් සහයෝගය නොදෙන පදනමින් ශ්‍රී ලංකාවේ මත්ස්‍ය අපනයනය යුරෝපා සංගමය විසින් තහනම් කරන ලදී.

ශ්‍රී ලංකාව අවට මුහුදු මාර්ග වල සාගර තදබදය වැඩි වී ඇති අතර ශ්‍රී ලංකාවේ වරායන්ට නෞකා පැමිණීමද වැඩිවෙමින් පවතී. එහි ප්‍රතිඵලයක් වශයෙන් අනාගතයේදී තෙල් කාන්දු වීම හා මුහුදු අනතුරු නිසා සාගරය දූෂණය වීමේ හැකියාව වැඩි වේ. මන්නාරම් ද්‍රෝණියේ වෙරළ ප්‍රදේශයට පිටතින් ප්‍රදේශයේ තෙල් කාන්දු වීම නිසා විධිමත් ආරක්ෂිත ක්‍රමවේද යොදා නොගත හොත් සාගර දූෂණය වැඩි වීමේ අනතුරක් ඇත. ජාතික වශයෙන් ගන්නා උත්සාහයන් මගින් සාගර දූෂණය පාලනය කල නොහැකි අතර අන්තර් ජාතික දූෂණ මූලාශ්‍ර ද හැසිරවීම අපහසුය.

ආක්‍රමණික පිටස්තර ජීවී විශේෂ පැමිණීමේ තර්ජනයක් ඇතිවන අතර පෙව ආරක්ෂණ ගැටළු ඇති කරයි.

ශ්‍රී ලංකාව විසින් වෙරළ හා සාගර සම්පත් කළමණාකරණය සඳහා සර්ව සම්පූර්ණ නෛතික ප්‍රතිපත්ති හා ආයතනික රාමුවක් සකස් කොට නිබුණ ද මෙම ප්‍රතිපත්තිමය රාමුව ක්‍රියාත්මක කිරීමේදී අකාර්යක්ෂම තත්වයන් ගණනාවක් ඇත. අවේක්ෂණ කටයුතු සිදු කිරීම වෙනුවෙන් පවතින සීමිත ධාරිතාව, නිරීක්ෂණය හා බලාත්මක කිරීම මෙම තත්වය සඳහා වගකිව යුතු ප්‍රධාන කරුණු වේ.

රජය විසින් සාගර මූලාශ්‍ර මඟින් මසුන් සැපයීම වැඩි කිරීම සඳහා සැලකිය යුතු උත්සාහයක් දරා ඇත .(ඉලක්ක 14.7) කෙසේ වුවද, පසුගිය දශක දෙක තුළ දී සිදු වූ ශීඝ්‍ර නිෂ්පාදන වර්ධනයට ප්‍රධාන වශයෙන්ම අදාළ වන්නේ නවීන යාත්‍රා වෙනුවෙන් සිදු කරන ලද ආයෝජනයන්ගේ වැඩි වීම සහ වෙරළාසන්න ගැඹුරු මුහුදේ දිගු දුර මත්ස්‍ය මෙහෙයුම් සිදු කිරීමට තුඩුදෙන ආකාරයේ තාක්ෂණයයි. මේ හේතුවෙන් මසුන් ඇල්ලීමේ යෙදෙන

යාත්‍රාවල ප්‍රමාණය 1980 සිට දෙගුණයක් වී ඇත. 1980දී යාත්‍රාවලින් %60ක් පමණම සාම්ප්‍රදායික යාත්‍රාවලින් සමන්විත විය. ඇතුළත එන්ජිම සහිත බහුදින යාත්‍රා, ඇතුළත එන්ජිම සහිත එක් දින යාත්‍රා, පිටත එන්ජිම සහිත FRP යාත්‍රා වැනි පෞද්ගලික අංශයෙන් ආයෝජනය කළ යාන්ත්‍රික බෝට්ටු ප්‍රමාණය ඒකාකාර ප්‍රමාණයකින් වැඩි වී සාම්ප්‍රදායික යාත්‍රා ප්‍රමාණය ඉක්මවන ලදී. ධීවර වරාය, තොටුපළ, ගබඩා හා වෙළඳපළ පහසුකම් සඳහා රජය මඟින් සපයන ලද යටිතල පහසුකම් පෞද්ගලික අංශයේ ක්‍රියාකාරකම් සඳහා පිටිවහලක් සපයන ලදී.

අහිතකර මසුන් ඇල්ලීමේ උත්සාහයන් ආශ්‍රිතව ඇතිවන පාරිසරික හා සම්පත් කළමණාකරණ ගැටළු මැඩපවත්වා ගැනීම සඳහා බෝට්ටු ලියාපදිංචි කිරීම, බලපත්‍ර නිකුත් කිරීම, හානිකර ධීවර පන්න භාවිතය

පාලනය කිරීම, දේශීය ධීවරයින් විසින් අධික ලෙස මත්ස්‍ය අස්වැන්න නෙළීම වළක්වාලීම කළමණාකරණය කිරීම සඳහා ධීවර සමිතිවල දායකත්වය ප්‍රවර්ධනය කිරීම වැනි නියාමන ක්‍රමවේද රජය විසින් ක්‍රියාත්මක කරයි. මෙම මැදිහත්වීම් ධීවර හා ජලජ සම්පත් පනතේ ප්‍රතිපාදනවලට අනුකූලව ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබයි. මෙම ක්‍රියාමාර්ග වල අරමුණ වන්නේ අධික ලෙස අස්වැන්න නෙලීම වැලැක්වීම සඳහා නිෂ්පාදන මට්ටම් තිරසාර සීමාවන් තුළ පවත්වාගෙන යාමයි..

06 - මානව සම්පත් පැතිකඩ

6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු/(අතිරික්ත)**
ජ්‍යෙෂ්ඨ	27	21	06
තෘතීයික	05	03	02
ද්විතියික	96	75	21
ප්‍රාථමික	51	42	09

6.2. ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇති ආකාරය.

පවත්නා පුරප්පාඩු නොතකා, වර්තමාන කාර්ය මණ්ඩලයට කාර්යක්ෂමව රාජකාරි ඉටුකිරීමට හැකිවී තිබේ.

සේවාව තවුරටත් වැඩිදියුණු කිරීම සඳහා පුරප්පාඩු පුරවාලීමට අදාල බලධාරීන්ට ඉල්ලීම් කර ඇත.

6.3. මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරනු ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (රු. '000)		වැඩසටහනෙ ස්වභාවය (දේශීය/විදේශීය)	නිමැවුම/ ලබා ගත් දැනුම
			දේශීය	විදේශීය		
රියදුරු පුහුණු වැඩ සටහන	13	දින 01 ක්	20,000/-	-	දේශීය	පුහුණු විෂය ක්ෂේත්‍රවල සමස්ත ඵලදායිතාව ඉහළ නංවා ඇත.
කාර්යාල ක්‍රම	55	දින 01 ක්	5,000/-	-	දේශීය	
ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය මගින් පවත්වන පොත් බැඳුම්කරණ පාඨමාලාව	කා: සේ: ස 6	සති 28 ක්	156 000/=	-	දේශීය	
"Advanced Certificate in public procurement and Asset Management" සහතිකපත්‍ර පාඨමාලාව	කළමනාකරණ සේවා නිලධාරී/ සංවර්ධන නිලධාරී 2	මාස 2 ක්	60 000/=	-	දේශීය	

“Online Workshop on Report Writing skills” පාඨමාලාව	සහකාර අධ්‍යක්ෂ 1	දින 3ක්	5000/=	-	දේශීය	පුහුණු විෂය ක්ෂේත්‍රවල සමස්ත ඵලදායිතාව ඉහළ නංවා ඇත.
“Online Workshop on Financial Regulation” පාඨමාලාව	සංවර්ධන නිලධාරී 2	2021.05.19-2021.05.21	10 000/=	-	දේශීය	
මානව සම්පත් කළමණාකරන සහතිකපත්‍ර පාඨමාලාව	පරිපාලන නිලධාරී 1	දින 5ක්	10 000/=	-	දේශීය	
කාර්යාල කලමනාකරණය හා මුදල් රෙගුලාසි පිළිබඳ පාඨමාලාව	සංවර්ධන නිලධාරී/ කළමනාකරණ සේවා නිලධාරී 67	දින 2ක්	70 000/=	-	දේශීය	
කාර්යාල කලමනාකරණය හා මුදල් රෙගුලාසි පිළිබඳ පාඨමාලාව	සංවර්ධන නිලධාරී/ කළමනාකරණ සේවා නිලධාරී 6	දින 2ක්	60 000/=	-	දේශීය	

07 - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූලවේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම්	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
01	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාල නැත		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්			
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්			
1.6	වෙනත්			
02	**පොත් පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2,2	පුද්ගල පඩිනඩි ලේඛණ/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2,3	විගණන විමසුම් ලේඛණය යාවත් කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත් කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GAN 20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
03	**මුල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ 135)**			
3.1	ආයතනය තුළ මුල්‍ය බලතල පවරා තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරා තිබීම පිළිබඳව ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
04	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිතදිනටඉදිරිපත්කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
05	**විගණන විමසුම**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල නොවේ	කොරෝනා වසංගතය නිසා ප්‍රමාද වීම් සිදුවීම	කඩිනමින් පිළිතුරු ලබාදීමට නියමිතය

06	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. (134) (2) DMA/1-2019 අනුව, වසරආරම්භයේදීවිගණකාධිපතිවරයාසමඟසාකච්ඡාකිරීමෙන්අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල නොවේ	කොරෝනා වසංගතය නිසා ප්‍රමාදවීම් සිදුවීම	කඩිනමින් පිළිතුරු ලබාදීමට නියමිතය
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
07	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA/1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	කළමනාකරණ විගණන චක්‍රලේඛ වලට අනුකූල වේ.		
08	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොන්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම.සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොන්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම	අනුකූල වේ		

8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපති වරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදුකිරීම	අනුකූල වේ		
09	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වා ගෙන යාම.	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		

11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කල පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එලඹීම	අනුකූල වේ		
12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන් වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල නොවේ	වර්ෂ 20කට වඩා පැරණි ණය ශේෂ වල තොරතුරු සොයාගැනීමට නොහැකි වීම	
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම සිදු කොට තිබීම	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිනුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		

15.3	මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා /චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි /සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි /සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		

19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල නොවේ	සකස් කෙරෙමින් පවතී	
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ (19.1 හි සඳහන්) 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩදටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩු පාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		